# මධ්‍යම සංස්කෘතික අරමුදලේ කතරගම කෞතුකාගාරය ප්‍රතිසංවිධාන කටයුතු සඳහා උපදේශකත්වය ලබා ගැනීම

- බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් ක්‍රියාත්මක රුහුණු මාගම්පුර ව්‍යාපෘතියේ කතරගම කෞතුකාගාරය ප්‍රතිසංවිධානය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය පහත සඳහන් උපදේශකවරුන්ගේ සේවය ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- මේ සඳහා අයදුම් කිරීමට කැමති අදාල විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ඇති විශේෂඥයන් 2026.06.10 දින වන විට පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් ලිපිනයට යොමු කළ හැකිය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**මධ්‍යම සංස්කෘතික අරමුදල,**
**212/, බෞද්ධාලෝක මාවත, කොළඹ 07**
**විද්‍යුත් ලිපිනය - officerda147@gmail.com**

අවශ්‍ය උප්දේශක සේවාවන්

01. පුරාවිද්‍යා උපදේශක

අපේක්ෂිත උපදේශකත්වය :-

හින්දු වතාවත් පිළිබඳ විශේෂඥ උපදේශක සමඟ සම්බන්ධ වී කෞතුකාගාරයේ ප්‍රදර්ශන තේමාව, Story Line යනාදිය සකස් කිරීම, ප්‍රදර්ශන සඳහා අවශ්‍ය පුරාවස්තු, භාණ්ඩ හඳුනා ගැනීම, ඒවා ප්‍රදර්ශන ශාලාවේ ස්ථානගත කිරීමට අදාල උපදෙස් ලබා දීම හා අභ්‍යන්තර සැළසුම් උපදේශක ට අවශ්‍ය විශේෂඥ තොරතුරු හා අවශ්‍ය සහය ලබා දීම හා ප්‍රදර්ශන කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය සියළු උපදේශකත්වය (විස්තරාත්මක පුවරු සඳහා අවශ්‍ය සැළසුම් හා Text වලට අදාල තොරතුරු ලබා දීම ද ඇතුළුව)

අවශ්‍ය සුදුසුකම් :-

- පුරාවිද්‍යා පිළිබඳ විශේෂවේදී උපාධියක් සහිතව හා පුරාවිද්‍යා පිළිබඳව දර්ශනශූරී උපාධියක් තිබීම
- පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ සාමාජිකත්වය ලබා තිබීම
- රුහුණු කතරගම ප්‍රදේශය පිළිබඳව පුරාවිද්‍යාත්මක පර්යේෂණ සිදු කර තිබීම.